# ඊයම් වියරුව සහ රෝමයේ නීරෝ



**පත්මකුමාර ජයසිංහ**
ව්‍යපෘති කලමණාකරු
විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන

ක්‍රිස්තුපූර්ව 600 දී පමණ කුඩා රාජ්‍යය-ක්ව ගොඩ නැගුණ රෝමය ඔගස්ටස් සීසර් ගේ නායකත්වය යටතේ ක්‍රිස්තු පූර්ව 27 දී අධිරාජ්‍යයක් වූ අතර එය වසර 500ක් පමණ කාලයක් පුරාවට පැවතුනි. ක්‍රිස්තු පූර්ව 500 සිට ක්‍රිස්තු වර්ෂ 300 දක්වා වූ කාලයේදී රෝමයේ ජලය ගෙන යාමට භාවිතා කලේ ඊයම් වලිනි සැදුන ලෝහ නලයි.

දිගු කාලීන ඊයම් විෂවීම ඉතා දරුණු ලෙස ස්නායු පද්ධතියට බලපෑම් ඇති කරයි. එපමනක් මෙම බැර ලෝහය හෘදය, වකුගඩු, අස්ථි සහ ලිංගික පද්ධතියට ද ඉතාමත් ප්‍රබලව හානි සිදු කරයි. මෙම ලෝහ විෂවීම හේතුවෙන් බඩේ රුදාව, නොසන්සුන්තාව, හිසරදය ද ඇතිකරන අතර සිහිමුර්ජාවීම ද අවසානයේ මරණයට ද පත් කරන්නට තරම් දරුණු වේ. බොහෝවිට තමා වැඩ කරන ස්ථානය ඇති ඊයම් හේතුවෙන් ඊයම් ශරීර ගත වීමට වැඩි ඉඩක් ඇති බව සමීක්ෂණ වලින් හෙළි වී ඇති අතර අමෙරිකාවේ මිලියන 3 පමණ වූ වැඩ කරන ජනතාව මෙලෙස ආසාදනයට ලක්වන වන බව හෙළි වී ඇත.

මෙම ලෝහය ශරීර ගත වීම ජලය, වාතය සහ ආහාර වලින් මෙන්ම පසෙන්ද විය හැක. කුඩා ළමුනට ඊයම් විෂ වීම ඉතා ප්‍රබලව ඔවුන්ගේ වර්ධනය වන ස්නායු පද්ධතියට බලපායි. එමනිසා මන්ද බුද්ධික භාවයට පත් වීමට බොහෝ ඉඩ කඩ ඇත. ඊයම් සහිත ලෝහ භාජන, තීන්ත වැනි නිෂ්පාදන භාවිතය, ඊයම් සහිත ඉන්ධන භාවිතය සහ ඊයම් ලෝහය නිස්සරණය කරන සහ කණින ප්‍රදේශවල ජිවත් වීම මගින් මෙම බැර ලෝහය ශරීර ගත වීම සිදු විය හැක.

ක්‍රිස්තුපූර්ව 6500 දී පමණ ඇනටෝලියාවේ මිනිසුන් ඊයම් නිස්සරණය කරගන්නට ඇති බව ඉතිහාසයෙන් කියවේ. මෙහි භාවිතයට ඇති පහසුවත්, මල නොකැමත් නිසා ජනප්‍රිය ලෝහයක්වක් ව එදා පැවතුනි.

ක්‍රිස්තුපූර්ව 600 දී පමණ කුඩා රාජ්‍යයක්ව ගොඩ නැගුණ රෝමය ඔගස්ටස් සීසර් ගේ නායකත්වය යටතේ ක්‍රිස්තු පූර්ව 27 දී අධිරාජ්‍යයක් වූ අතර එය වසර 500ක් පමණ කාලයක් පුරාවට පැවතුනි. ක්‍රිස්තු පූර්ව 500 සිට ක්‍රිස්තු වර්ෂ 300 දක්වා වූ කාලයේදී රෝමයේ ජලය ගෙන යාමට භාවිතා කලේ ඊයම් වලිනි සැදුන ලෝහ නලයි. බිමට ගන්න භාජන ද සකස් වී තිබුනේ ඊයම් ලෝහයෙනි.

මෙම නල වල කබෝනේට සමග ප්‍රතික්‍රියාවෙන් සුදූ පැහැති ඊයම් කබෝනේටය තැනුණු අතර ඒවා “සුදූ ඊයම්” ලෙස හැදින්වුණි. එකල්හි රෝම ජාතිකයන්ගේ පාද වල සන්දි වල වූ රත්තවාත තත්වය මෙනිසා හට ගන්නට ඇතැයි විශ්වාස කරනු ලැබේ. ජල නල භාවිතයට අමතරව, ඊයම් සහ ඇසිටික් අම්ල මිශ්‍රණයෙන් තැනුණු රසක-ාරකය (මට්ර දෙ කේා) ඔවුන්ගේ වයින් රසවත් කිරීමට යොදා ගති.

ක්ලෝඩියස් අධිරාජ්‍යයාගේ මරණින් පසු එම පරපුරේ අවසානයා ලෙස රජ කමට පත්වන්නේ නීරෝ ක්ලෝඩියස් සීසර් ය. වැඩිපුරම විනෝදය සදහා කාලය ගත්කල නීරෝ රංග මණ්ඩල තැනීමටත්, ජවන තරග පැවැත්වීමටත් බොහෝ උත්සුක වූ වෙකි. කෙසේ වෙතත් ඔහුගේ කාලයේදී රෝමය ගිනිගත් අතර ඒ සදහා මූලික වුයේ නිරෝම බව සමහරකු ගේ මතයයි. ඒ එම ගින්නට පසු තැනුණු ඇති විශාල “ඩොමස් ඖරියා” නම් වූ ගොඩනැගිලි සංකීර්ණය සහිත උද්‍යානය තැනීම සදහා බවයි.

කෙසේ වෙතත් ක්‍රිස්තු වර්ෂ 68 දී පමණ සිව දිවි නසා ගන්නා මෙම අධිරාජ්‍යයා රෝමය ගිනි ගනිද්දී විණා වාදනය කල බව ප්‍රකට කරුණකි. විද්වතුන් සැක කරන විදියට රෝම ශිෂ්ටාචාරය ක්‍රමයෙන් බිඳ වැටීමට හේතුවුයේ ඔවුන් අධිකව කල ඊයම් භාවිතයයි. එසේ නම්, දිගු කාලීනව ඊයම් භාවිතය නිසා නීරෝ හට කුඩා කල සිටම ඊයම් ශරීර ගත වන්නට ඇති බව නිගමනය කල හැක. එය ඔහුගේ ස්නායු අසමතුලිතතාවය සදහා හේතුවන්නටද ඇත. එසේ නම් රෝමය ගිනි ගනිදිදී ඔහු විණා වාදනය කරන ලද්දේ ඊයම් විස වීමෙන් ඇති වූ වියරුවෙන් ද..?




සිහින ලුහුබැඳීම අත්හරින්නේ
වියපත් බව නිසාම යන්න
සත්‍යයක් නොවේ.
වියපත් වීම අරඹන්නේ
සිහන ලුහුබැඳීම අත්හල විටය.

ගාබ්රියෙල් ගාර්ෂියා මාකේස්

රටවල් 40ක සිට ශ්‍රී ලාංකිකයන් අසන ගුවන්විදුලිය - තිසර www.thisara.com